1633 - II


# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
## மாவட்ட செயலகம் - அநுராதபுரம
## District Secretariat - Anuradhapura

Fax : 025 - 2222235 E-mail :- dissecanu@sltnet.lk

| | දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலகர் / District Secretary | අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மாவட்டசெயலாள / Addi.District Secretary | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவட்ட செயலாள / Asst.District Secretary | ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் / Chief Accountant | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Admin Officer |
|---|---|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | 025 - 2235479<br>025 - 2222235 | 025 - 2235048 | 025 - 2222236 | 025 - 2222706 | 025 - 2222237 |
| නිවස/வீடு/Res. | 025 - 2222205 | 025 - 2223833 | | 53299 | 025 - 2235537 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: | ANU/AGS/18/01/02/ නාච්චාදූව | ඔබේ අංකය / உமது இல. / Your No: | | දිනය / திகதி / Date : | 2020.06.08 |

18 JUN 2020

අධ්‍යක්ෂ ( වාරි කළමණාකරණ )

වාරි කළමණාකරන අංශය,

තැ.පෙ.1702

වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 07

**<u>මහ වාරිමාර්ග ව්‍යාපාර කන්න රැස්වීම් තීරණ ගැසට් පත්‍රයේ පල කිරීම</u>**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සදහන් මහා වාරි ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා පැවැත්වූ වගා කන්න රැස්වීම් තීරණ ඔබ වෙත යොමු කරමි.

02. මෙම තීරණ ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. නාච්චාදූව මහා වාරිමාර්ග ව්‍යාපාරය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර

පිටපත්

1. කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ , කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර- කා.දැ.පි / අ.ක.ස
2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාච්චාදූව - කා.දැ.පි / අ.ක.ස
3. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, නාච්චාදූව - කා.දැ.පි / අ.ක.ස
4. නේවාසික ව්‍යාපාර කළමණාකරු , නාච්චාදූව ව්‍යාපාරය - කා.දැ.පි / අ.ක.ස

# ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

නාච්චාදූව මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද නාච්චාදූව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා **"විශේෂ ව්‍යාපාර කළමණාකරන කමිටු වගා රැස්වීම"** 2020.05.12 දින නාච්චාදූව නේවාසික ව්‍යාපාර කාර්යාලයහිදී පැවැත්වූ අතර එහිදී 2020 යල කන්නයේ වගා කටයුතු සඳහා පහත සහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

**2020 යල කන්නයේ වගා කාල සටහන**

| අනු අංකය | කාරණය | හීං ඇල සහ මහ ඇල දිවුල් වැවේන් ඉහළ කොටස | මහ ඇල දිවුල් වැවෙන් පහළ කොටස |
|---|---|---|---|
| 01 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය ( අක්කර ) | 4500 | 2500 |
| 02 | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | හීං ඇල සහ මහ ඇල දිවුල් වැවේන් ඉහළ කොටස | මහ ඇල දිවුල් වැවෙන් පහළ කොටස |
| 03 | වගා කරන බෝග | වී මාස 3 , 3 ½ ( අක්කර 4000 )<br>අතිරේක බෝග ( අක්කර 500 ) | වී මාස 3 , 3 ½ ( අක්කර 1625 )<br>අතිරේක බෝග ( අක්කර 875 ) |
| 04 | ප්‍රධාන ඇළ වේළි ශුද්ධ කර අවසන් කල යුතු දිනය ( වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ) | 2020.04.15 ට පෙර | 2020.05.12 ට පෙර |
| 05 | බෙදුම් ඇල,කෙත් ඇල හා අපවහන ඇල ශුද්ධ කර අවසන් කල යුතු දිනය ( ගොවි සංවිධානය මගින් ) | 2020.04.15ට පෙර | 2020.05.12 ට පෙර |
| 06 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකල ඇල වේලි ගොවි සංවිධානය විසින් අවසන් කළ යුතු දිනය | 2020.04.19 ට පෙර | 2020.05.12 ට පෙර |
| 07 | ජලාශයෙන් ජලය නිකුත් කල යුතු දිනය | 2020.04.20 | 2020.05.12 |
| 08 | බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය | 2020.04.20 | 2020.05.12 |
| 09 | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.05.10 | 2020.05.25 |
| 10 | මුර ජල කාලය | දින 2.5 | දින 2.5 |
| 11 | මුර ජලය ආරම්භ වන දිනය | 2020.05.13 | 2020.05.28 |
| 12 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.08.08 | 2020.08.25 |
| 13 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.05.10 | 2020.05.25 |
| 14 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.16 | 2020.09.02 |
| 15 | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | 2020.09.10 | 2020.09.25 |

## සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි

1. හීං ඇල සහ මහ ඇල දිවුල් වැවෙන් උඩ කොටස 2020.05.10 දින සිට 2020.09.10 දක්වා කාලය තුළ යායට ගවයින් ඇතුල් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
2. මහ ඇල දිවුල් වැවෙන් පහල කොටස 2020.05.25 දින සිට 2020.09.25 දක්වා කාලය තුල යායට ගවයින් ඇතුල් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
3. සෑම ඇලකම ජලය නිකුත් කිරීම අගාවත සිට ඉහලට යන පදනම මත සිදු කෙරේ.
4. කුඹුරු ඉඩම් නොවන ඉඩම් වගා කිරීම සඳහා වාරිමාර්ග ජලය කවර ආකාරයකින් හෝ ලබා ගැනීම සපුරා තහනම්.
5. සම්මත කරගත් දිනෙන් පසුව කවර හේතුවක් නිසාවෙන් හෝ ජලය නිකුත් කිරීම දීර්ඝ කරණු නොලැබේ.
6. නියමකර ඇති දිනට පෙර ඇල වේලි ශුද්ධ කර නොමැති නම් එම කාර්යය නිම වන තුරු එම ඇලට ජලය නිකුත් කරණු නොලැබේ. ( නියමිත දිනට ඇල වේලි ශුද්ධ කිරීම පැහැර හරින කුඹුරු හිමියන්, වගා කරුවන්ගෙන් බඹයකට රු. 250.00 ක් බැගින් දඩ මුදලක් අය කර ගැනීමට අදාල ගොවි සංවිධානයට අවසර දෙනු ලැබේ. )
7. ඇල වේලි නඩත්තු හා වැඩි දියුනු කිරීම වෙනුවෙන් වගා කරණු ලබන සෑම අක්කර 01 ක් සඳහා රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.
8. ඇලවේළි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිනවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඩුවමට ලක්වනු ඇත.
9. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
10. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
11. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වය හෝ කිසියම් පාලනය කරගත නොහැකි බාහිර උපද්‍රවයක් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති කළමණාකරන කමිටුව සතුය.
12. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.